Collaborative Curriculum
and Assessment Framework
for Languages

Student/Registration Number | | | | | | | | | | | |

Centre Number | | | | | | |

# 2025 Sinhala Examination

## Continuers Level

**Date:** Thursday 16 October 2025, 2 pm Australian Eastern Daylight Time

- Reading time: **10 minutes**
- Working time: **2 hours**
- Total marks: **65**

### Approved materials

- Black or blue pens
- Monolingual and/or bilingual printed dictionaries

### Materials supplied

- Question-and-answer booklet

### Instructions

- You may consult your dictionaries during reading time and also during the examination.
- Write all your answers in the spaces provided in this booklet. The spaces provided give you an idea of how much you should write.
- You **must not** write during reading time.

### Contents

page(s)

**Section 1** – Responding to texts

- **Question 1** (7 marks) .......... 3
- **Question 2** (8 marks) .......... 4–5
- **Question 3** (15 marks) .......... 6–9

**Section 2** – Creating texts

- **Question 4** (15 marks) .......... 10–13
- **Questions 5 and 6** (20 marks) .......... 14–18

© VCAA 2025

VICTORIAN CURRICULUM AND ASSESSMENT AUTHORITY

VICTORIA State Government

**This page is blank.**

# **Section 1** – Responding to texts (30 marks)

Allow approximately 50 minutes for Section 1.

**Question 1** – Listening in Sinhala and responding in English (7 marks)

## Instructions

- Text 1 will be played twice. There will be a short break between each playing.
- You may write notes at any time in the space provided. These notes will not be assessed.
- Listen carefully to the text and then answer the questions in **ENGLISH**.
- Responses in languages other than English will not be assessed.
- All responses **must** be based on the text.

---

**Your response will be assessed on how well you:**

- analyse general and specific relevant information, ideas, opinions, perspectives and/or aspects of texts to convey meaning.

---

**Question 1** **Marks**

Write your notes here. Notes will **not** be assessed.

**a.** List **three** valuable personal skills, according to the speaker. **3**

______________________________

______________________________

______________________________

**b.** Complete the table below by filling in the social skills and the importance of each. Some examples have been provided. **4**

| Social skill | Importance |
|---|---|
| working collaboratively | |
| listening effectively | |
| | builds and manages social relationships |
| | contributes to social harmony |

## **Question 2** – Listening and responding in Sinhala (8 marks)

### Instructions

- Text 2 will be played twice. There will be a short break between each playing.
- You may write notes at any time in the space provided. These notes will not be assessed.
- Listen carefully to the text and then answer the questions in **SINHALA**.
- Responses in languages other than Sinhala will not be assessed.
- All responses **must** be based on the text.

---

**Your response will be assessed on how well you:**

- analyse general and specific relevant information, ideas, opinions and/or perspectives to convey meaning.

---

**Question 2** **Marks**

Write your notes here. Notes will **not** be assessed.

**a.** According to the discussion, why is Sri Lankan cinnamon known as 'genuine cinnamon'? **2**

මෙම සාකච්ඡාවට අනුව ශ්‍රී ලංකාවේ කුරුඳුවලට 'සැබෑ කුරුඳු' යැයි කියන්නේ ඇයි?

**b.** Describe the traditional process of cinnamon preparation. **4**

පාරම්පරික කුරුඳු සකස් කිරීමේ ක්‍රියාවලිය විස්තර කරන්න.

**Marks**

Write your notes here. Notes will **not** be assessed.

**c.** According to the speakers, how can cinnamon improve health? **2**

කථිකයන්ට අනුව කුරුඳුවලින් සෞඛ්‍යය වැඩිදියුණු වන්නේ කෙසේද?

---
---
---
---

**Question 3** – Reading and listening in Sinhala, responding in English (15 marks)

## Instructions

- This question consists of a reading text, Text 3A, and a related listening text, Text 3B.
- You have 5 minutes to read Text 3A. At the end of the 5 minutes, Text 3B will be played. The text will be played twice. There will be a short break between each playing.
- You may write notes at any time in the space provided. These notes will not be assessed.
- Answer the questions in **ENGLISH**.
- Responses in languages other than English will not be assessed.
- All responses **must** be based on the text(s).

---

**Your response will be assessed on how well you:**

- analyse general and specific relevant information, ideas, opinions, perspectives and/or aspects of texts to convey meaning
- synthesise relevant information, ideas, opinions and/or perspectives from different texts.

---

## Text 3A

**නවීන දේශීය නාට්‍ය කලාව**

ගමගේ සුමිත් පමෝද් විසිනි

සම්ප්‍රදායික ශ්‍රී ලාංකීය ඇදහිලි සහ ජන නාට්‍ය රටේ විවිධ ප්‍රදේශවලින් ආරම්භ වී ඇති අතර ඒ අනුව ඒවාට ආවේණික වූ ලක්ෂණ තිබේ. පත්තිනි දේවිය වෙනුවෙන් කරනු ලබන පූජාවක් ලෙස මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වූ 'සොකරි' හි ගැහැනු චරිත නිරූපණය කළේ පිරිමින් ය. වර්ණවත් වෙස් මුහුණු පාවිච්චි කරමින් දකුණු වෙරළබඩ ප්‍රදේශවල පැවැත් වූ 'කෝලම්' විනෝදාත්මක අනුකරණයන් විය. රටේ උතුරු ප්‍රදේශයෙන් ආරම්භ වූ 'නාඩගම්' හි සිටින පොතේ ගුරු විසින් රංගනය කෙරෙහි නරඹන්නන්ගේ අවධානය රඳවා ගන්නා ලදී.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මැතිතුමා වර්ෂ 1914 දී ගාල්ලේ, දොඩන්දූව ගමේ උපත ලබා පිටපත් රචකයකු, නවකතාකරුවකු, කවියකු, සාහිත්‍ය සහ සමාජ විචාරකයෙකු ලෙස ප්‍රසිද්ධියට පත්විය. තරුණ වයසේදී ඔහු ශ්‍රී ලාංකීය සම්ප්‍රදායික ඇදහිලි සහ ජන නාට්‍ය පිළිබඳව පර්යේෂණ කළේය. එම සොයා ගැනීම් 'නවීන දේශීය නාට්‍ය කලාව' නිර්මාණයේදී ඔහු අනුවර්තනය කරගත්තේ ය.

එය ඇගයීමට ලක්කරමින් වර්ෂ 1988 දී ඔහුට 'රේමන් මැග්සේසේ' සම්මානය ප්‍රදානය කරනු ලැබීය. ඔහුගේ නාට්‍ය ජනප්‍රිය වීමට හේතු වූයේ ඒවා දේශීය ජනතාවගේ මූලාශ්‍රවලට සමීප වූ ජාතක කතා සහ ජන කතා පදනම් කරගත් නිසා ය.

**Text 3A – continued**

මිනිස් හැඟීම් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කර ඒවා තම නාට්‍යවලට ඇතුළත් කිරීමෙන් ප්‍රේක්ෂකයන්ට සුවිශේෂී අත්දැකීමක් ලබාදීමට ඔහුට හැකිවිය. මෙය මනමේ, සිංහබාහු, ලෝමහංස වැනි නාට්‍යවලින් පැහැදිලි වෙයි. එමෙන්ම ඔහු එකල පැවතුන සමාජීය සහ සංස්කෘතික ගැටළු අලුත්ම නිර්මාණ ලෙස ඉදිරිපත් කිරීමෙන් නරඹන්නන්ට සිතන්නට යමක් දායාද කළේය. මේ නිසා තම නිර්මාණ මඟින් බොහෝ නාට්‍ය නරඹන්නන්ගේ හදවත්වලට සමීප වීමට සරච්චන්ද්‍රයන්ට හැකිවිය.

මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ 'නවීන දේශීය නාට්‍ය කලාව' අනුගමනය කරන වර්තමාන නාට්‍ය නිර්මාණකරුවන් මේ වනවිට මුහුණපා තිබෙන ගැටළු කීපයකි. වර්තමානයේ වේගයෙන් ඉදිරියට ඇදී යමින් පවතින සමාජයක ජීවත්වන රංගන ශිල්පීන්ට මෙන්ම නාට්‍ය නරඹන්නන්ටද කාලය සීමාකාරී සාධකයක් වී තිබේ. ඒ ඔවුන්ගේ පුද්ගලික, රාජකාරී සහ සමාජීය වගකීම් නිසාය. ඒ හැරුණු විට අද වනවිට කලාව ද වාණිජකරණයට හසුවී තිබේ. එහෙයින් සජීවී රංගන කලාවට මුදල් ආධාර අවශ්‍ය වී ඇත. ඒ සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීම වර්තමාන නාට්‍ය නිර්මාණකරුවන්ට ප්‍රශ්නයක් වී තිබේ.

You may make notes in this space. These notes will **not** be assessed.

**Question 3** **Marks**

Write your notes here. Notes will **not** be assessed.

**Text 3A**

**a.** Complete the table below to identify the characteristics of the following Sri Lankan folk drama performances. **3**

| Type of folk drama | Characteristic of performance |
|---|---|
| Sokari | |
| Kōlam | |
| Nādagam | |

**Text 3B**

**b.** Provide four features of the play *Maname* that are mentioned in the conversation. **4**

- ______________________________
- ______________________________
- ______________________________
- ______________________________

**Texts 3A and 3B**

| | | Marks |
|---|---|---|
| **c.** | Explain how Sarachchandra's modern indigenous theatre has affected Sri Lankan theatregoers. | **4** |
| **d.** | What are the challenges currently faced by modern indigenous theatre practitioners? | **4** |

Write your notes here. Notes will **not** be assessed.

**End of Section 1**

## **Section 2** – Creating texts (35 marks)

Allow approximately 70 minutes for Section 2.

**Question 4** – Reading and responding in Sinhala (15 marks)

### Instructions

- Read Text 4 and write a response of approximately 150 words in **SINHALA**.
- Question 4 is phrased in both English and Sinhala.
- Responses in languages other than Sinhala will not be assessed.

---

**Your response will be assessed on how well you:**

- analyse relevant information, ideas, opinions and/or perspectives from the stimulus text(s)
- respond to the question appropriately for the context, purpose and audience
- use appropriate language structures and vocabulary accurately.

---

### Text 4

**සංචාරක පාගමන්**

ශ්‍රී ලංකාවේ උතුරු මැද ප්‍රදේශයේ පිහිටි උසම කඳුවැටිය වන රිටිගල නැරඹීමට සංචාරක පාගමන් සමාගම මගින් විශේෂ පැකේජයක්!

අපේ අරමුණ කුඩා කණ්ඩායම් සඳහා, පෞද්ගලික රුචියට ගැළපෙන අපූරු අත්දැකීමක් ලබා දීමයි.

රිටිගල දී ගල්ගුහා, පැරණි පිළිම, විශාල පොකුණු මෙන්ම පුස්තකාලයක නටබුන් පවා දැකිය හැකිය. අපගේ මනා පුහුණුව ලැබූ සංචාරක මඟ පෙන්වන්නන් සිත් ඇදගන්නා සුළු පුරාවිද්‍යාත්මක සාක්ෂි ඔබට පෙන්වනු ඇත.

මෙහි දර්ශනීය දියඇලි ගණනාවක් සහ දිය පාරවල් හරහා යාමට සාදන ලද පැරණි ගල් පාලම් ද තිබේ. මෙවැනි ස්ථාන නැරඹීමේදී ඔබට අමතක නොවන අත්දැකීමක් ලබාදෙන්නන් ලෙසට අප සමාගම ප්‍රසිද්ධ ය.

කඳුපාමුල පවතින වියළි, උණුසුම් දේශගුණයට සාපේක්ෂව කඳු මුදුන ඉතා සිසිල් නිසා හදිසි කාලගුණ වෙනස්වීම් නිතර ඇතිවේ.

දහවල් මෙන්ම රාත්‍රියේදී ද පාගමන් පැවැත්වේ. කෙටිම පාගමනට පැය 3–4 ක් ගතවේ. සියලුම ස්ථාන බැලීමට දින 2–3 ක චාරිකාවක් අනුමත කෙරේ. ආහාරපාන, ප්‍රවේශපත්‍ර මෙන්ම සංචාරක මඟ පෙන්වන්නන් ද පැකේජයට ඇතුළත් ය. පාගමනට අවශ්‍ය වන බොහෝ උපකරණ අඩු මිලකට අපෙන් ලබා ගත හැකි ය.

You may make notes in this space. These notes will **not** be assessed.

**Question 4**

During your recent visit to Sri Lanka, you and a few of your friends visited Ritigala mountain with the tour company Hiking Tours. Write a review for the company’s website evaluating your tour.

මෑතකදී ශ්‍රී ලංකාවට ගිය අවස්ථාවේ ඔබ සහ යහළුවන් කිහිපදෙනෙක් සංචාරක පාගමන් සමාගම සමඟ රිටිගල කඳුවැටියේ සංචාරය කරන ලදී. ඔබේ සංචාරය ඇගයීමට ලක්කරමින් සමාගමේ වෙබ් අඩවියට සමාලෝචනයක් ලියන්න.

## **Questions 5 and 6** – Writing in Sinhala (20 marks)

### Instructions

- Question 5 and Question 6 are written in English and Sinhala.
- Choose **one** question, either Question 5 **or** Question 6.
- Write a response of approximately 250 words in **SINHALA**.
- Responses in languages other than Sinhala will not be assessed.

---

**Your response will be assessed on how well you:**

- create text appropriate for the context, purpose and audience
- demonstrate depth of treatment of information, ideas, opinions or perspectives
- sequence information, ideas, opinions or perspectives cohesively
- use a range of appropriate language structures and vocabulary
- use vocabulary and language structures accurately.

---

**Question 5** (20 marks)

As the president of the School Development Committee, you propose modernising the library at your school. Write a letter to your principal, persuading them to modernise the library so that it can be used by the whole school community.

පාසල් සංවර්ධන සමිතියේ සභාපති ලෙස, පාසල් පුස්තකාලය නවීකරණය කිරීමේ අවශ්‍යතාවය ඔබ විසින් යෝජනා කරන ලදී. පාසලේ සෑම දෙනාටම ප්‍රයෝජනවත් වන පරිදි පුස්තකාලය නවීකරණය කරන ලෙස පොළඹවමින් විදුහල්පතිට විධිමත් ලිපියක් ලියන්න.

**OR**

**Question 6** (20 marks)



Source: addkm/Shutterstock.com

Using information in the image above, write a diary entry reflecting on a volunteering experience you have had. End the diary entry with, ‘It changed how I see the world.’

ඉහත දැක්වෙන රූපයේ ඇතුළත් තොරතුරු උපයෝගී කරගෙන ඔබ ස්වේච්ඡා සේවයෙහි යෙදෙන විට ලැබූ අත්දැකීමක් පිළිබඳව දින සටහනක් ලියන්න. ‘මෙය මා ලෝකය දකින ආකාරය වෙනස් කළා’ යන වාක්‍යයෙන් දින සටහන අවසන් කරන්න.

You may make notes in this space. These notes will **not** be assessed.

Select either Question 5 **or** Question 6 by placing a tick (✓) in one of the boxes below.

Question 5 ☐ Question 6 ☐

**End of examination questions**

**Extra space for responses**

Clearly **number** all responses in this space.

© Victorian Curriculum and Assessment Authority 2025